**උද්භිද උද්‍යාන භාර අරමුදල - 2023**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උද්භිද උද්‍යාන භාර අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1996 දෙසැම්බර් 20 දිනැති උද්භිද උද්‍යාන භාර අරමුදලේ භාරකාර ඔප්පුවෙහි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව

සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව තැන්පත් ගිණුමේ ශේෂය රු.247,300,685 ක් වුවද, අරමුදලේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව රු.246,265,439 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,035,246 ක වෙනසක් පැවතුණි. | 2024 වර්ෂය තුල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි ශේෂයන් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඉකුත් වර්ෂයේ වෙනත් ආදායම් රු. 696,580 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීමේ වරද නිවැරදි කිරීම සඳහා සන්සන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරිමේදී, අඩුකළ යුතු රු.696,580 ක් එකතු කර තිබු අතර මෙම වෙනස සමාලෝචිත වර්ෂයේ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන තුළ ගලපා තිබුණි. | ඉදිරි ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි ශේෂයන් හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | වටිනාකම (රු.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල වසා දැමීමට අමාත්‍ය මණ්ඩලය තීරණයක් ලබා දී තිබියදී, එසේ කටයුතු නොකර මෙම | - | ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කර ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කැබිනට් | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| හාර අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කිරීමට කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කර සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. | පත්‍රිකාවක් කෙටුම්පත් කර සංචාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.200,260,522 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.101,335,943 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.98,924,579 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රවේශපත්‍ර ආදායම ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ රු. 3,344,731 කට ඉදිකර තිබූණු ළමා අධ්‍යාපනික ඒකකයට අයත් කොන්ත්‍රාත්තුවේ, වැඩ විෂයන් දෙකකට අදාලව ඉටු නොකළ වැඩ සඳහා රු.174,627 ක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ඉටු නොකළ වැඩ සඳහා ගෙවා ඇති මුදල් අදාල පාර්ශ්ව වෙතින් අයකළ යුතුය. |

### 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වසර 08ක කාලය තුලදී අවශ්‍යතාවය පිළිබඳ නිසි ඇගයීමකින් තොරව රු.8,168,765 ක පිරිවැයක් දරා මුද්‍රණය කරන ලද පොත් වර්ග 06 කට අදාළව පිටපත් 4250කින් රු.7,111,375 ක පිටපත් 3636ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දින වන විටත් අලෙවි කර ගැනීමට නොහැකිව නිශ්කාර්යයව පැවතුණි. | කොවිඩ් 19 තත්ත්වය මත සංචාරකයන් අඩුවෙන් පැමිණීම, හා රාජකීය උද්භිද උද්‍යානයේ වර්ෂ 200 සැපිරීමට සමගාමීව පැවැත්වීමට නියමිත වූ සමාරම්භක උත්සවය නොපැවැත්වීම හේතුවෙන් අලෙවිය අඩු වී ඇති බව. | නිසි ඇගයීමක් සිදු කර අවශ්‍යතාවය හඳුනාගෙන පොත් මුද්‍රණය කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේදී අවශ්‍යතාවය පිළිබඳව නිසි ඇගයීමකින් තොරව රු.5,796,360 ක් වැයකර මිලදී ගෙන තිබුණු සමරු ඵලක හා කැක්ටස් බඳුන් 7000 ක් අතරින් රු.4,591,876 ක සමරු ඵලක හා කැක්ටස් බඳුන් 5507 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අලෙවි කර ගැනීමට නොහැකිව නිශ්කාර්යයව පැවතුණි. | රාජකීය උද්භිද උද්‍යානයේ වර්ෂ 200 සැපිරීමට සමගාමීව පැවැත්වීමට නියමිත වූ සමාරම්භක උත්සවය නොපැවැත්වීම හේතුවෙන් අලෙවිය අඩු වී ඇති බව හා මිල සංශෝධනය කර අලෙවි කිරීම සඳහා කටයුතු කරන බව. | අවශ්‍යතාවය මත මිලදී ගැනීම් සිදු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරකම් 23 ක් වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන රු.53,985,000 කින් රු.19,557,129 ක් උපයෝජනය කර නොතිබුණු අතර, ක්‍රියාකාරකම් 03 කට අදාළව සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | පිරිවිතර වලට අනුකූලවන පරිදි ලංසු ඉදිරිපත් නොවීම, සැපයුම්කාර ආයතනය විසින් ප්‍රතිචාර නොදැක්වීම, ආනයනයේදී බාධා ඇති වීම, බිල්පත ඉදිරිපත් නොවීම, 2023 වර්ෂයේ අවසන් මාස 06 තුළ අඛණ්ඩ වර්ෂාපතනයක් පැවතීම හා කාර්යය අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. | ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |